දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை

"සෞභාග්‍යයේ දැක්ම" / "For a prosperous future"

පළමු මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට. 1ஆம் மாடி, மாகம்புர நிர்வாக கட்டிடத் தொகுதி, ஸ்ரீபோபுர, ஹம்பாந்தோட்டை. 1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota


මගේ අංකය / எனது இலக்கம் / My No: DSH/DPS/07/DCC/වාර්තා/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No:

දිනය / திகதி / Date: 2024.12. 31

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - *2024.12.24*</u>**

2024.12.24 වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතනවල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථාවලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03.ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය දින 14 ක් ඇතුළත මා වෙත *DCC Hambantota WhatsApp* වෙත හෝ *dpshambantota@gmail .com* වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04.තවද, මෙම වාර්තාව *www.hambantota.dist.gov.lk* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

**බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා**
**දිස්ත්‍රික් ලේකම්/දිසාපති**
**හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.**

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

පිටපත්:-

01 දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමා - කරු.දැ.ගැ.ස.

02 හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා -කරු.දැ.ගැ.ස

03.ජනාධිපති ලේකම් - දැ.ගැ.ස

04.ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස


| | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / District Secretary – 047 2256235 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(පාලන) / மேலதிக மாவட்ட செயலாளர் (நிர்வாகம்) / Additional District Secretary (Admin) – 047 2256232 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්) / மேலதிக மாவட்ட செயலாளர் (காணி) / Additional District Secretary (Land) – 047 2256002 | ප්‍රධාන ගණකාධිකාරී / கணக்காளர் / Chief Accountant – 047 2256246 |
| අධ්‍යක්ෂ (කෘෂිකර්ම) / பணிப்பாளர் (விவசாயம்) / Director (Agriculture) – 047 3628890 | අධ්‍යක්ෂ (සැලසුම්කරණ) / பணிப்பாளர்(திட்டமிடல்) / Director (Planning) – 047 2256234 | සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மாவட்ட செயலாளர் / Assistant District Secretary – 047 2256945 | පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer – 047 2256285 |
| කාර්යාලය / அலுவலகம் / Office | ෆැක්ස් / தொலை நகல் / Fax – 047 2256235, 047 2256247 | ඊ මේල් / மின்னஞ்சல் / email : moha.dist.hambantota@gmail.com; වෙබ් අඩවිය / இணையத்தளம் / Web site : www.hambantota.dist.gov.lk | |

**2024.12.24**

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2024.12.24 වන දින පෙ.ව. 9.30ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයින් හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමන් වෙත රැස්වීමේ ඉදිරිකටයුතු කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

නව රජය බලයට පත් වී පවත්වනු ලබන පලමු සම්බන්ධීකරන කමිටුව මෙය බව සඳහන් කරමින් නව සභාපති තුමා විසින් පැමිණ සිටි සියළුම දෙනා පිළි ගන්නා ලදී . ඉන්පසු රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සියළු කටයුතු සිදු කරමින් පොහොසත් රටක් බිහි කිරීම සඳහා සියළු දෙනා කැප වීමෙන් කටයුතු කල යුතු බවත් නීතියට අනුව කටයුතු කරන සියළු නිලධාරීන් ආරක්ෂා කිරීමට රජය නිරන්තරව කටයුතු කරන බවත් දැනුම් දෙන ලදී. අනතුරුව, ගරු සභාපති තුමන් විසින් පසුගිය වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කරන ලද අතර එම කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | හම්බන්තොට වරායට පැමිණෙන මගී නෞකා සඳහා පහසුකම් සැපයීමේ ප්‍රගතිය විමසීම | රියදුරන් සඳහා පුහුණුවීම් ලබා දී ඇති බවත් බලපත්‍ර ලාභීන් සඳහා ටෝකන් එකක් ලබාදීමට තීරණය වී ඇති බවත් එය මෙතෙක් දැනුම් දී නොමැති බවද ප්‍රකාශ කරන ලදී. | නිරන්තරයෙන් පසු විපරම් කරණ ලෙසත් මෙම සියළුම ආයතන එක් වී සාකච්ඡා කර මීළග දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස තීරණය කරන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට |
| 02 | කව්විගල්ආර හන්දියේ ඇති බෝ ගස ඉවත් කිරීම සම්බන්ධව | බෝගස ඉවත් කිරීම සඳහා පුද්ගලයන් ඉදිරිපත් නොවීම නිසා මේ දක්වා අදාළ කටයුත්ත සිදුකර ගැනීමට නොහැකි වූ බව දැනුවත් කරන ලදී. තවද බෝගස් ඉවත් කිරීමට විශාල මුදලක් වැයවන බැවින් එය සපයා ගැනීම ගැටළු සහගත බවත් දැනුම්දෙන ලදී.<br>බෝගස ඉවත් කිරීම සඳහා ප්‍රදේශයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේලා සම්බන්ධ කරගනිමින් ආගමික වතාවත් සිදුකර ඉවත් කරගැනීමේ හැකියාව පවතින බැවින් ඒ අනුව කටයුතු කලහැකි බවත් ගස් ඉවත් කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව සම්බන්ධ වියයුතු බවත් දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය සභා සතු අරමුදල් මෙවැනි කාර්යයන් සඳහා නිදහස් කිරීමට පළාත් සභාවෙහි එකඟතාවයන් ලබා දීමට කටයුතු කරන බවත් අදාළ ආයතන එක්වී මෙම කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රධාන ලේකම් - දකුණු පළාත<br><br>සියලුම ප්‍රාදේශීය ලේකම්වරු<br><br>පළාත් පාලන ආයතන ප්‍රධානීන්<br><br>සහකාර අධ්‍යක්ෂ - රාජ්‍ය දැව සංස්ථාව<br><br>සහකාර අධ්‍යක්ෂ- ආපදා කළමනාකරණ<br><br>බෞද්ධ කටයුතු සමායෝජක |
| 03 | කාර්මික සංවර්ධන මණ්ඩලයට ඉඩමක් පවරා දීම සම්බන්ධව (වීරකැටිය අග්‍රහැර පැරණි ගුවන් විදුලි සංස්ථාව පිහිටුවා තිබූ අක්කර 98 න් අක්කර 20ක පමණ බිම් කොටස.) | මූලික කටයුතු සඳහා අදාළ ආයතන වලට ලිපි ලේඛන ලබ දී ඇති බවත් සාමාන්‍ය කටයුතු සිදු කරමින් පවතින බවටත් දැනුම් දෙන ලදී. | දැනටමත් මාස 04කට වැඩි කාලයක් ගතව ඇතත් කටයුතු අවසන්ව නොමැති බවත් මීළඟ සම්බන්ධීකරණ කමිටුවට පෙර සියළුම කටයුතු අවසන් කර සම්බන්ධීකරණ කමිටුව වෙත වාර්තා කළයුතු බවට උපදෙස් ලබාදෙන ලදී. | ප්‍රාදේශීය ලේකම්, වීරකැටිය<br><br>ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරී-කාර්මික සංවර්ධන මණ්ඩලය |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| | | | | |
|---|---|---|---|---|
| 04 | දෙබරවැව ජනාධිපති විද්‍යාලයට යාබද වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ඉඩමෙන් කොටසක් පාසල් ක්‍රීඩාංගනය සඳහා ලබාගැනීම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස වලට හානි සිදුවන බැවින් 10m ප්‍රමාණයක් ලබාදීමේ ගැටළුවක් පවතින නිසා මෙය සිදුකළ නොහැකි බැවින් මෙම කටයුතු ප්‍රමාද වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. තවද පාසලට මෙම ප්‍රමාණය ලබාදීමෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් තාප්පයෙන්කොටසක් ද කැඩෙන ද බවත් ප්‍රකාශ විය. | අඩි 10ක ප්‍රමාණයක් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය මත ලබාදීමටත් කටයුතු කරන ලෙසත් කැඩෙන තාප්පය පාසලේ වියදමින් සකස් කර දෙන ලෙසත් උපදෙස් ලබා දෙන ලදී. | දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ<br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ- හම්බන්තොට |
| 05 | අනවසර දැව ඉවත් කිරීමේ රාජකාරි සිදුකරන නිලධාරීන්හට දැව ජාවාරම්කරුවන්ගෙන් එල්ලවන බලපෑම් සම්බන්ධව | මේ පිළිබඳ මේ දක්වා රාජකාරි සිදු වී නොමැති බව වාර්තා විය. එමෙන්ම ඇතැම් පොලිස් නිලධාරීන්ගේ රාජකාරි සම්බන්ධව ගැටළු පවතින බවත් පොලිස් නිළධාරීන් සම්බන්ධව මහජනතාව සතු විශ්වාසය පලුදු වී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. යම් පොලිස් ස්ථානකින් රාජකාරියක් සිදුනොවේ නම් එම පොලීසිය සම්බන්ධව අදාළව සහකාර පොලිස් අධිකාරීවරයෙකු සිටින බැවින් ඔහු දැනුවත් කලහැකි බවටත් තොරතුරු ඉදිරිපත් විය.<br>තවද අනවසර දැව අල්ලාගත් පසු ඒවා අදාළ පොලීසිය වෙත ප්‍රවාහනය සඳහා දැව සංස්ථාවේ සහයෝගය අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් විය. | ආයතන අතර සම්බන්ධතාවන් ආරක්ෂාවන පරිදි කටයුතු කලයුතු බවටත් කටුවන පොලීසියෙන් මේ සම්බන්ධව වාර්තාවක් ලබාගත යුතු බවටත් තීරණය විය. එමෙන්ම පොලීසිය සම්බන්ධව පවතින මහජන මතය නිවැරදි කරන බවත් මහජන ආරක්ෂාව හා සාමය ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය වර්ග සම්බන්ධව කරන වැටලීම් පිළිබඳ වාර්තාවක් මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන බවට තොරතුරු ඉදිරිපත් විය.<br>එමෙන්ම, මත්ද්‍රව්‍යය අපරාධ සම්බන්ධව පොලීසිය විසින් සිදුකරන වැටලීම් වලට අදාළ ප්‍රගතිය මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කළයුතු බවට තීරණය කරන ලදී. | නියෝජ්‍ය පොලිස්පති දකුණු පළාත<br>ප්‍රාදේශීය ලේකම් කටුවන<br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී - තංගල්ල<br>නි. පොලිස්පති<br>සහකාර අධ්‍යක්ෂ, රාජ්‍ය දැව සංස්ථාව |
| 06 | සංවර්ධන වැඩසටහන් සම්බන්ධව | | | |
| I | මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේ අධිකව වැය වන විදුලි බිල අවම කර ගැනීම සඳහා සෝලා පද්ධතියක් ස්ථාපිත කිරීම හා ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීම. | වියදම අඩුකරගැනීම සඳහා සෝලා පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකරන බවට තොරතුරු ඉදිරිපත් විය. | අදාල කටයුතු කඩිනම් කරගන්නා ලෙසත් නඩත්තු වියදම් සම්බන්ධ වාර්තාවක් මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙසත් දැනුවත් කරන ලදී. | පළාත් අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය<br>ප්‍රධාන විදුලි ඉංජිනේරු, හම්බන්තොට<br>සුනිත්‍ය බලශක්ති අධිකාරිය |



බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

SCAN AnyScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| II | ගොඩවැලි කැණීම් බලපත්‍ර ලබා දීම සම්බන්ධව | දිස්ත්‍රික්කය පුරාම පරිසර බලපත්‍ර නොමැති ගල්/ වැලි/ පස් ඉවත් කිරීම් සිදුවන බවටත් පිරිසර පද්ධතිය ආරක්ෂා කරගැනීම සඳහා මෙම සියළු අනවසර ක්‍රියා නතර වියයුතු බවටත් කරුණු ඉදිරිපත් විය. තවද වලවවත්ත බරවකුඹුක රිදියගම ආශ්‍රිතව සිදුවන අනීතික වැලි කැනීම් නිසා කුඹුරු වලට සපයන ජලය පවා නිසි පරිදි කළමනාකරණය කරගත නොහැකි බවත් පෙන්වා දෙන ලදී. තවද බලපත්‍ර ලබා දී ඇති වැලි කැනීම් නිසි පරිදි නියාමනය කර වැලි වලවල් නිසි ප්‍රමිතියට ගොඩකිරීම් කරන ලෙසටත් උපදෙස් දෙන ලදී. තවද දැනට වැලි ගැරීමෙන් ව්‍යවසනයක් බවට පත් වී ඇති අම්බලන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වැලි කැපීම් නතර කරදෙන ලෙසටත් යෝජනා විය. | මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට වැලි/ ගල්/ පස් වෙනුවෙන් දැනට නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව හා එම ආයතන වල තොරතුරු ඉදිරිපත් කරන ලෙසත් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අවසරයකින් තොරව මැණික් ගැරීමට බලපත්‍ර දී ඇති ආකාරය සම්බන්ධ වාර්තා කරනා ලෙසටත් උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>ප්‍රාදේශිය ලේකම් අම්බලන්තොට<br><br>කැනීම් ඉංජිනේරු භූ විද්‍යා හා පතල් කාර්යාංශය<br><br>මැණික් හා ස්වර්ණාබරණ අධිකාරිය සහකාර අධ්‍යක්ෂ - පරිසර අධිකාරිය |
| III | තෙල් පිරිපහදු මධ්‍යස්ථානයක් වන සිනොපෙක්ස් ආයතනය සඳහා ජලය ලබා ගැනීමේදී ඇති වී තිබෙන ගැටලු | කුඹුරු වලට ජලය සපයන අවස්ථාවලදී මෙම ව්‍යාපෘතිය සඳහා ජලය සැපයීම දුෂ්කර වන බවට කරුණු ඉදිරිපත් විය. | මෙ සම්බන්ධව ගතහැකි විසඳුම් සම්බන්ධ වාර්තාවක් මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශිය ලේකම් අම්බලන්තොට<br><br>වාරිමාර්ග අධ්‍යක්ෂ හම්බන්තොට |
| IV | කෘෂි රක්ෂණ මණ්ඩලය මගින් සිදු කරන වගා හානි තක්සේරු හැර තක්සේරු කිරීමේදී පැන නැගී ඇති ගැටලු සඳහා අවශ්‍ය විසඳුම් ලබා ගැනීම | තක්සේරු කිරීම කඩිනම් කරගන්නා ලෙසත් ඒ සඳහා එක් එක් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහාය ලබාගත යුතු බවත් දැනුම් දෙන ලදී. විවිධ ක්ෂේත්‍ර සම්බන්ධව (ගම්මිරිස්, කුරුඳු, තේ .....) නිළධාරීන් රාශියක් සිටියත් ඔවුන් ඍජුවම ගොවීන් සමඟ සම්බන්ධ වීමට ක්ෂේත්‍රයට නොපැමිණීම නිසා ගැටළු ඇති වී තිබෙන බවටත් වාර්තා විය. තවද එම නිළධාරීන් ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට අනුයුක්තව සිටියත් ඔවුන් අධීක්ෂණය කිරීමේ හැකියාවක් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත පැවරී නොමැති බවත් වාර්තා විය. | සියළුම ක්ෂේත්‍ර නිළධාරීන් අනිවාර්යෙන්ම ක්ෂේත්‍රයට යායුතු බවත් එම නිලධාරීන් නිසි අධීක්ෂණයක් යටතේ කටයුතු කළ යුතු බවටත් තීරණය කරන ලදී. | දිස්ත්‍රික්කයේ සියළුම ආයතන ප්‍රධානීන් |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 07 | වනඅලි ගම්වැදීම සම්බන්ධ ගැටලු | වන අලි තර්ජන ඇතිවීමට ප්‍රධානතම හේතුව අවිධිමත් ලෙස ඉඩම් බැහැර කිරීම වන බවත් එක් එක් පුද්ගලයන්ට වගාවන් සඳහා ඉඩම් ලබාදීමෙ දී කිසිදු පදනමක් නොමැති බවත් ඇතැම්විට එම වගාවන් වටෙ අලි වැටවල් ඉදිකිරිම කර ඇති බවටත් අදහස් දැක්වීය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ලබා දී ඇති වාහන 05ක් නිසා අලින් ගම්වැදීම වැලැක්වීමට කණ්ඩායම් යොදවා ඇති බවත් වනජීවි දෙපාර්තමේන්තුව සතුව ප්‍රමාණවත් නිලධාරි කණ්ඩායම් නොමැති බවටත් කරුණු ඉදිරිපත් විය. | රක්ෂිත භූමිය තුල පරිසර බලපත්‍ර රහිතව සිදු කරන සියලුම ව්‍යාපෘති නතර කරන ලෙසට උපදෙස් ලබාදුන් අතර සති 02ක් ඇතුලත ඉඩම් ලබා දී ඇති පදනම සම්බන්ධව වාර්තා කරන ලෙසටත් උපදෙස් දෙන ලදී. | වන ජීවි අධ්‍යක්ෂ ජනරාල්<br><br>නේවාසික ව්‍යාපාර කළමනා කරු -මහවැලි<br><br>ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය<br><br>සහකාර අධ්‍යක්ෂ වනජීවි |
| 08 | ජල සම්පාදන මණ්ඩලය මඟින් මාර්ගවල එලා ඇති ජල නල මාර්ග සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමේදී යටවීම සම්බන්ධ ගැටළු | කිරම වරාපිටිය මාර්ගය පුළුල් කිරීමේදී පවුල් 400 ක් පමණ ප්‍රතිලාභීන් පිරිසකගේ ජල අවශ්‍යතාවය ආවරණය කෙරෙහි ප්‍රජාජල ව්‍යාපෘතීන් 03 ක ජල නල යටවන බවට කරුණු ඉදිරිපත් විය. නමුත් මෙම ව්‍යාපෘති සඳහා සකස් කර ඇති ඇස්තමේන්තුවේ ජලනල එලීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් කර නොමැති බැවින් ව්‍යාපෘතියේ මුදල් යොදවා ජලනල එලීම කළ නොහැකි බවටත් කරුණු ඉදිරිපත් විය. | පළාත් සභාවේ ප්‍රතිපාදන යටතේ ඉදිරි වර්ෂයේදී මේ සඳහා ප්‍රතිපාදන ලබා දීමට තීරණය විය. එමෙන්ම මාර්ග පුළුල් කිරීම් ව්‍යාපෘති සම්බන්ධව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සාකච්ඡා කර ඇස්තමේන්තුවලට මෙවැනි වියදම් ඇතුළත් කර ගත යුතු බවට උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරු<br><br>ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>දිස්ත්‍රික් ඉංජිනේරු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>ප්‍රාදේශීය කළමනාකරු ජල සම්පාදන මණ්ඩලය<br><br>ස්ථානභාර නිලධාරී ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව |

**අනතුරුව 2024.12.24 දිනට අදාළ න්‍යාය පත්‍රයේ කරුණු සාකච්ඡා කරන ලදී. ඒවා පහත පරිදි වේ.**

| අ.අ. | කාරණය | සාකච්ඡාවූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | සංවර්ධන වැඩසටහන් සම්බන්ධ ප්‍රගතිය | | | |
| I | විමධ්‍යගත අයවැය වැඩසටහන | 2024 වර්ෂය සඳහා<br>• විමධ්‍යගත අයවැය වැඩසටහන<br>• විමධ්‍යගත අයවැය විශේෂ වැඩසටහන<br>• පාසල් සංවර්ධන වැඩසටහන<br>• ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන<br>• පාසල් ක්‍රිකට් සම්බන්ධ වැඩසටහන<br>ඇතුළු ව්‍යාපෘති ක්‍රියාත්මක වූ බවත් එම වැඩසටහන් ක්‍රියාත්මක කලයුතු ආකාරය හා සම්බන්ධව ලබාදි ඇති චක්‍රලේඛ උපදෙස් හා ව්‍යාපෘති නතර කිරීම | ප්‍රගති වාර්තා අමාත්‍යාංශය වලට නිසි පරිදි යොමු කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>අධ්‍යක්ෂ ක්‍රම සම්පාදන (වැ.බ.) |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

AnyScanner

| | | | | |
|---|---|---|---|---|
| | | සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ලබා දී තිබූ උපදෙස් පරිදි ක්‍රියාත්මක කර මේ වනවිට අවසන් කර ඇති බවත් ඒවායේ ප්‍රගතිය පහත් පරිදි වන බවත් දන්වන ලදී.<br>විමධ්‍යගත අයවැය වැඩසටහන යටෙත් ව්‍යාපෘති 903 ක් අනුමත වූ බවත් ඉන් 886 ක් අවසන් කර රු මිලියන 345.37 වියදම් කල බවත් විමධ්‍යගත අයවැය විශේෂ වැඩ සටහන යටෙත් ව්‍යාපෘති 313 ක් අනුමත වූ බවත් ඉන් 302 ක් අවසන් කර රු මිලියන 35.94 වියදම් කල බවත් පාසල් සංවර්ධන වැඩසටහන යටෙත් ව්‍යාපෘති 08 ක් අනුමත වූ බවත් ඒම 08 ම අවසන් කර රු මිලියන 37 වියදම් කල බවත්<br><br>ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටෙත් ව්‍යාපෘති 03 ක් අනුමත වූ බවත් ඒම ව්‍යාපෘති 03 ම අවසන් කර රු මිලියන 8.36 වියදම් කල බවත්<br><br>මාර්ග සංවර්ධන වැඩසටහන යටෙත් ව්‍යාපෘති 38 ක් අනුමත වූ බවත් ඒම ව්‍යාපෘති 38 ම අවසන් කර රු මිලියන 99.11 වියදම් කල බවත්<br><br>ප්‍රජා ජල සංවර්ධන වැඩසටහන වැඩසටහන යටෙත් ව්‍යාපෘති 17 ක් අනුමත වූ බවත් ඒම ව්‍යාපෘති 17 ම අවසන් කර රු මිලියන 8.11 වියදම්කල බවත්<br><br>පාසල් ක්‍රිකට් සංවර්ධන වැඩසටහන වැඩසටහන යටෙත් ව්‍යාපෘති 06 ක් අනුමත වූ බවත් ඒම ව්‍යාපෘති 06 ම අවසන් කර රු මිලියන 9.00 වියදම්කල බවත් දැනුම් දෙන ලදී. | | |

02. කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව (පුද්ගලයින්) | අනුමත ප්‍රතිපාදන මුදල (රු.මිලි.) | නැවත පවරා දුන් ප්‍රතිපාදන මුදල (රු.මිලි.) | වර්තමාන ප්‍රතිපාදන මුදල (රු.මිලි.) | වියදම් කළ මුදල (රු.මිලි) | වියදම් කළ යුතු මුදල (රු.මිලි) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. එළවන් ඇති කිරීමේ ව්‍යාපෘතිය | 01 | 32 | 32.82 | 29.9 | 2.81 | 0.09 | 2.72 | 0.03% | 50% |
| 02. උඳු/මුං භෝග වගා ව්‍යාපෘතිය | 01 | 2556 | 24.75 | - | 24.75 | 24.72 | 0.03 | 99% | 100% |
| 03. ආහාර සුරක්ෂිත තාවය හා තාක්ෂණය වැඩසටහන | 04 | 120 | 32.54 | - | 32.54 | 20.23 | 12.31 | 62% | 80% |
| 04. තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන ව්‍යාපෘතිය | 88 | 1310 | 209 | 28 | 181 | 32 | 149 | 17% | 80% |
| මුළු එකතුව | | 4018 | 299.11 | 57.9 | 241.1 | 77.04 | 164.06 | | |

| අ.අ. | කාරණය | සාකච්ඡාවූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 03 | පළාත්සභා අමාත්‍යාංශ මගින් සිදුකරණ සංවර්ධන වැඩසටහන | පළාත් සභා සංවර්ධන වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පළාත් නිශ්චිත ප්‍රධාන රු.මි. 536.39 ක්ද උපමාන පාදක යටතේ රු.මි.97.45 ක් ද නම්‍යශිලී අරමුදල යටතේ රු.මි. 5.85 ක් ද විශේෂ ව්‍යාපෘති යටතේ රු.මි.31.47 ක් ද ලෝක බැංකු ආධාර වැඩසටහන් යටතේ රු.මි.75.64 ක් ද වශයෙන් රු.මි. 746.84 ක් ආයෝජනය කර ඇති බව දැනුම් දෙන ලදි.<br><br>ඒ අනුව, පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් රු.මි. 220.6 ක් ද අධ්‍යාපන අමාත්‍යාංශය මගින් රු.මි. 134.7 ක් ද කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් රු.මි. 114.9 ක් ද ධීවර අමාත්‍යාංශය මගින්රු.මි. 107.9 ක් සහ ක්‍රීඩා අමාත්‍යාංශය මගින් රු.මි. 55.7 ක් ද වශයෙන් වෙන්කරදී ඇති බව දන්වන ලදි.<br><br>එමෙන්ම, පළාත් නිශ්චිත ප්‍රධාන හා උපමාන පාදක ප්‍රධාන යටතේ | | ප්‍රධාන ලේකම් දකුණු පළාත<br><br>ලේකම්වරු දකුණු පළාත් සභා අමාත්‍යාංශ |



බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

AnyScanner

| | | | | |
|---|---|---|---|---|
| | | ක්‍රියාත්මක වන බව දැනුම් දෙන ලදී. | | |
| 04 | දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ තොරතුරු ඉදිරිපත් කිරීම | ජලභීතිකා රෝගයෙන් 2024 වර්ෂයේ මරණ 03ක් සිදු වී ඇති බවත් සුනඛයින් සපා කෑමේදී ලබා දිය යුතු එන්නත් සඳහා අධික මිලක් වැය වීමත් මත සුනඛ ගහනය අඩු කිරීම සඳහා වන්ධ්‍යාකරණය කිරීම කළයුතු බවට අදහස් ඉදිරිපත් විය. එසේම එන්නත්කරණය සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් ප්‍රමානවත් නොවන බවත් ,ශ්‍රමිකයින් ලබා දෙන්නේනේ නම් ඔවුන් සති දෙකක් ඇතුළත පුහුණු කර ගතහැකි බවට අදහස් දක්වන ලදී. | ප්‍රාදේශීය සභාවල සෞඛ්‍ය කම්කරුවන් සිටින බවත් ඉන් දෙදෙනෙකු බැගින් ලබා දිය හැකි බවත් , 2025 වර්ෂයේ සෞඛ්‍ය සඳහා වෙන් කර ඇති මුදලින් වන්ධ්‍යාකරණ සැත්කම් කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීමට තීරණය කරන ලදී | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| | අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය රෝහල් භූමිය තුළින් ජලය බැස ගිය කාණුව පස් හා කොන්ක්‍රීට් යොදා වසා දැමීම නිසා වැසි ජලය බැස යාම අවහිර වීම. | රෝහලට සහ ව්‍යාපාරිකයින් 07 ක් සඳහා වෙන්කර දී ඇති මහවැලි අධිකාරියට අයත් භූමියේ වැසි ජලය බැස යාම සඳහා තිබූ කානුව සියලු කොන්දේසි උල්ලංඝනය කරමින් කඩහිමියන් විසින් ගොඩකිරීම හේතුවෙන් රෝහල තුළ එකතුවන වැසි ජලය නිසිලෙස බැස නොයෑම නිසා ගොඩනැගිලි වැසි ජලයෙන් යටවීම , ගලිවලවල් උතුරායාම, මෝචරිය අවට භූමිය යටවීම නිසා එය භාවිතයට ගත නොහැකි තත්ත්වයකට පත්වීම වැනි පාරිසරික හා සෞඛ්‍ය ගැටලු රාශියක් මතු වී ඇති බැවින් එය නිරාකරණය කර ගත යුතු බවට අදහස් ඉදිරිපත් කරන ලදී. | අනවසර ඉදිකිරීම කඩිනමින් නතර කරන ලෙසත් අදාළ සියලු ආයතන එක්වී සාකච්ඡා කර විසඳුමකට එළඹ එය ඊළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී තංගල්ල<br><br>ප්‍රාදේශීය ලේකම් අඟුණුකොළපැලැස්ස<br><br>නේවාසික ව්‍යාපාර කළමනාකරු,මහවැලි ප්‍රාදේශීය සභාව අඟුණුකොළපැලැස්ස<br><br>නාගරික සංවර්ධන අධිකාරිය |
| 05 | පසුගිය දිනවල අධික වැසි සමග ඇතිවූ ආපදා තත්ත්වය | වෙනත් දිස්ත්‍රික්ක හා සංසන්දනය කිරීමේ දී මෙම දිස්ත්‍රික්කය තුළ සිදු වූ ආපදා අවම මට්ටමක පවතින බවත් සිදුවන ආපදාවන් සඳහා දිස්ත්රික් ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකරණ ඒකකය අනෙකුත් ආයතන සමඟ සම්බන්ධ වී අවශ්‍ය කටයුතු සිදුකළ බවත් දන්වන ලදී.<br>එහෙත් මෙම දිස්ත්‍රික්කයේ සිදු වූ ආපදා සම්බන්ධයෙන් නිලධාරීන්ගෙන් ලැබුණු සහයෝගය අඩු බවත් මේ දක්වා ආපදා වෙනුවෙන් ගෙවීම්කර නොමැති බවට පාර්ලිමේන්තුවේදී සාකච්ඡා වූ බවටත් දැනුම් දෙන ලදී. නමුත් 2022, 2023 වර්ෂ වලට අදාළව මේ වසරේ දී ලැබී ඇති මුදල් සියල්ලම ගෙවා අවසන් බවත් සියළුම නිළධාරීන්ගේ උපරිම සහයෝගය ආදදා කළමාණාකරන කටයුතු වෙනුවෙන් ලැබෙන බව දැනුම් දෙන ලදී. | හදිසි ආපදා තත්ත්වයන් වලදී සියළුම ආයතන සම්බන්ධ වී අදාළ කටයුතු කළමනාකරණය කරගත යුතු බවට උපදෙස් දෙන ලදී | දිස්ත්‍රික්කෙය් සියළුම ආයතන ප්‍රධානීන්<br><br>සහකාර අධ්‍යක්ෂ (ආපදා) |
| 06 | දිස්ත්‍රික සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් වූ ගැටළු | | | |
| I | හම්බන්තොට පොල් පිටිය 220 KV විදුලි සම්ප්රේෂණ මාර්ගය මං විවර කිරීම | හම්බන්තොට පොල්පිටිය විදුලි සම්ප්රේෂණ රැහැන් මාර්ගය ගමන් ගන්නා බැල්ලගස්වැවව ග්‍රාම නිලධාරි වසමෙ ඩී.එස් සේනානායක ආදර්ශ ගම්මානයේ විරෝධතා ඉදිරිපත් කර ඇති ඉඩම් හිමියන්ට වන්දි ගෙවීම සලකා බැලීමේ දී අදාල ඉඩම් වල පදිංචිකරුවන් හා ලංකා විදුලි බල මණ්ඩලය මහවැලි අධිකාරිය, නිවාස සංවර්ධන අධිකාරිය, තක්සේරු දෙපාර්තමේන්තුව යන ආයතන එක්ව කරන ලද සාකච්ඡාවේදි වන්දි ගෙවීම් සඳහා ලබාදුන් එකහතාවයන්ට පදිංචිකරුවන් | මේ පිළිබඳ අධ්‍යයනය කර වාර්තා කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට<br><br>විදුලි ඉංජිනේරු (ව්‍යාපෘති) - හම්බන්තොට |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

AnyScanner

| | | | | |
|---|---|---|---|---|
| | | එකඟ නොවීම. | | |
| II | ප්‍රවාහන අපහසුතා | සවස 04.00 පසුව මෙම පරිපාලන සංකීර්ණය හරහා බස්රථ ධාවනය නොවීම නිසා නිලධාරීන් මෙන්ම මහජනතාව අපහසුතාවයට ලක්වන බවටත් කරුණු ඉදිරිපත් වූ අතර එහිදී ප්‍රකාශ වූයේ ගුවන් පාලම සිට පරිපාලන සංකීර්ණය දක්වා මීටර් 800 කට ආසන්න දුරක් පවතින බවත්, ඒ සඳහා යම් පිරිවැයක් බස්රථවලට දැරීමට සිදුවන නිසා මෙවැනි තත්ත්වයක් උද්ගතව ඇති බවත්ය. | මේ සම්බන්ධව ජාතික ගමනා ගමන කොමිෂන් සභාව, ශ්‍රී ලංගම, පොලිසිය සහ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය එක්ව අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් |
| III | සූරියවැව මීගහජඳුර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ B ගේට්ටුව අසලින් පහළට දිවෙන මාර්ගයේ ජලනළ එලීම | මීගහජඳුර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ B ගේට්ටුව අසලින් දිවෙන ගුරුපාර ඔස්සේ රුහුණුපුර ජල ව්‍යාපෘතියෙන් ලැබෙන ජලය නල මාර්ග ඔස්සේ රැගෙනයාම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අවසර නොලැබෙන බැවින් එම කටයුත්ත ප්‍රමාදවන බවට කරුණු ඉදිරිපත් විය. නමුත් දැනටමත් ආයෝජන මණ්ඩලයේ සීමාව වෙන්කර ඇති බවත් ජල නල එලීම සඳහා අවශ්‍ය මායිම පෙන්වා දී ඇති බවත් ඒ ඔස්සේ අදාල කටයුතු කරගතහැකි බවටත් තොරතුරු ඉදිරිපත් කරන ලදී. | පෙන්වා දී ඇති මාර්ගය හරහා ජලනල එලීම සිදුකරගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | නි. අධ්‍යක්ෂ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>ලේකම් - සූරියවැව ප්‍රාදේශිය සභාව |
| IV | වී අලෙවි මණ්ඩලයට අයත් ගබඩා අළුත්වැඩියා කරගැනීම | මෙම දිස්ත්‍රික්කය තුළ වී අලෙවි මණ්ඩලයට අයත් ගබඩා 18ක් ඇති බවත් ඉන් 03ක් ඉතිරි ඒවා වසර 50කටත් වඩා වැඩි පැරණි ඉදිකිරීම් නිසා අළුත්වැඩියා කර ගතයුතු බවත් ඉදිරි වගාකන්නයේ වී මිල දී ගැනීම සඳහා මෙම අළුත්වැඩියාවන් කරදෙන ලෙසත් ඉල්ලීම් කරන ලදී. | එම ගබඩා අයත්වන ප්‍රා.ලේ. කා. වල සිටින කාර්මික නිළධාරීන් මඟින් අදාළ අළුත්වැඩියාවන් සඳහා ඇස්තමේන්තු සකස් කරදෙන ලෙස දන්වන ලදී. | අදාළ කොට්ඨාස වල ප්‍රාදේශිය ලේකම්වරුන්<br>ප්‍රදේශිය කළමනාකරු - වී අලෙවි මණ්ඩලය |

මේ සමහම ප්‍රාද්ශීය සම්බන්ධීකරණ කමිටු වෙනුවෙන් පත්කර ඇති ගරු සභපතිවරුන් කමිටුවේ දී හඳුන්වා දී ප්‍රාදේශිය වශයෙන් පවතින ගැටලු සාර්ථකව විසඳා ගැනීම සඳහා කටයුතු කරන ලෙසත් එහිදී විසඳා ගැනීමට නොහැකි ගැටළු පමණක් මෙම කමිටුවට ඉදිරිපත් කරන ලෙසත් දැනුම් දෙමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තුතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු 3. 30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

2024 දෙසැම්බර් මස ....31 වැනි දින.
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.